# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX | YEAR OF OUR LORD JESUS CHRIST, 2024 DECEMBER | Issue No. 01


## ශුද්ධවූ බයිබලය

### (ලූක් 1:28-35)

28. ඔහු ඈ සිටි තැනට පැමිණ: බොහෝ කරුණාව ලැබූ තැනැත්තිය, ශුභසිද්ධවේවා, ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටිනසේකැයි කීවේය.

29. නුමුත් ඈ ඔහුගේ කීමට බොහොසේ කැලඹී, මේ කෙබඳුවූ ආචාරයක්ද කියා කල්පනාකරමින් සිටියාය.

30. දේවදූතයා ඈට කථාකොට: මරියා, භය නොවන්න. මක්නිසාද නුඹට දෙවියන්වහන්සේගෙන් කරුණාව ලැබුණේය.

31. බලව, නුඹ හාර්භණීව පුත්‍රයෙකු බිහිකරන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබන්න.

32. උන්වහන්සේ උතුම්ව මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝයයි කියනු ලබනසේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙව්වූ ස්වාමීන්වහන්සේ උන්වහන්සේට දෙනසේක.

33. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම්කරනසේක; උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේයයි කීයේය.

34. එවිට මරියා දේවදූතයාට කථාකොට: මා පුරුෂයෙකු නෑඳින සිටින බැවින්, මේක වෙන්නේ කෙසේදැයි කීවාය.

35. දේවදූතයා ඈට උත්තරදෙමින්: ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙනසේක, මහෝත්තමයාණන්ගේ ආනුභාවද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබනසේක.

## ක්‍රිස්තුස්වහන්සේ තුළ දේව සමාදානය! නත්තලේ ආත්මය වැළඳගමු !

THE PEACE OF GOD IN CHRIST! Embracing the True Spirit of Christmas!

*(ප්‍රධාන කර්තෘ දේවගැති ඒන්ජලින් සෙල්වකුමාරි)*



නිවාඩු කාලය ආරම්භ වන්නා වූ මේ මොහොතේදී මුළු ලෝකයාම සෑම තැනම නත්තල් සමරන පිණිස විදුලි ආලෝකය, ප්‍රීතිමත් කැරොල් ගායනා කිරීම ආදී බොහෝ දේවලින් මෙය සැමරීමට උත්සාහ කරයි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සාමාන්‍යයෙන් සම්ප්‍රදායික උත්සවයක් නොමැතිව මනුෂ්‍යයා සමාදානය, සුවය හා බලාපොරොත්තුව ගෙන දෙන්නා වූ නත්තලෙකි. යේසුස්වහන්සේ තුළින් මේ සමයේදී අපට මහත් ප්‍රීතියක් පමණක් නොව අපට සුවය සහ පාපයෙන් මිදීමත් ගෙන දෙන සේක.

## ක්‍රිස්තුස්වහන්සේගේ උපතෙහි තිබෙන්නාවූ සමාදානයේ පණිවිඩය !

මතෙව් සහ ලූක් ශුභාරංචිවල සඳහන් කර තිබෙන්නාවූ නත්තලේ කතන්දරයෙන් මිනිස් සමාජයට බලාපොරොත්තුව උදාවන බව පෙන්වා දෙයි. දේවදූතයා විසින් එඬේරුන්ට ප්‍රකාශ කරනු ලැබූයේ; ***"ඉතා උසස් තැන්හි දෙවියන් වහන්සේට මහිමයද පොළොවෙහි උන්වහන්සේට ප්‍රියවූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානය ද වේවා." (ලූක් 2:14)*** දේවදූතයින් විසින් සමාදානය ප්‍රකාශ කරන විට ක්‍රිස්තුස් වහන්සේගේ උපත තුළ ප්‍රීතිය

....Contd. to page 4




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.


Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## from your dearly beloved brother...

REACHING NATIONS





## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**HON. MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**

Echo of His Call


"The LORD is near to all who call upon Him,
To all who call upon Him in truth." – Psalm 145:18

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උතුම් නාමය, එනම්, සියලු නාමයන්ට වඩා උසස් වූ ඒ නාමය ඇමතීම ඉතා මහත් වූ වරප්‍රසාදයකි.

දෙවියන්වහන්සේගේ කරුණාවෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප ඉතාම සුරැකිව සිටිමු. රෝගාතුරුව සිටි අපගේ සියලුම සේවකයින්ට දෙවියන්වහන්සේ අතගසා ඔවුන්ගේ සියලු රෝග වලින් ඔවුන්ව සුවකර තිබේ.

දෙවියන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන ඔක්තෝම්බර් මස 10 වන දින විශේෂ කාන්තා කඳවුරක් පැවැත්වෙමු. එම කඳවුරේදී අපගේ සඟරාවේ ප්‍රධාන කර්තෘ වන සහෝදරී සෙල්ව කුමාරි දෙවියන්වහන්සේගේ පණිවිඩය බෙදා ගත්තේය. මෙම කඳවුරට සහභාගී වූ සියලු කාන්තාවන් දෙවියන්වහන්සේගේ අතගැසීම කරණකොටගෙන ඔවුන්ගේ පුද්ගලික ජීවිතයට හා පවුල් ජීවිතයට සුවය හා ආශිර්වාදය ලබා ගත්තේය.



*Special camp for ladies at Main Church*

මේ ආකාරයටම පුරුෂයින්ද යෝෂුවා රණශූරයින් යන තේමාව යටතේ මහවැලිපුරම් යන ස්ථානයෙහි කඳවුරක් පැවැත්විය. බස් රථ දෙකකින් පුරුෂයින් 70 ක් පමණ මෙම කඳවුරට සහභාගී වුවෙමු. විශේෂ දේශකයින් මෙම කඳවුරෙහි දේශනා කලෝය. මෙම කඳවුරේදී යාච්ඤා කාලයන් ක්‍රීඩා කාලයන් සාක්ෂි බෙදා ගැනීමේ හා කැපවීමේ කාලයන්ද තිබුණි. පසුබටවී සිටී සමහර පුරුෂයින් නැවත දෙවියන්වහන්සේ වෙතට සහභාගී වන බවට පොරොන්දු විය. සහභාගී වූ සෑම දෙනාටම උදෑසන ආහාරය දිවා ආහාරය හා තේ පානය මෙන්ම ටී ෂර්ට් එකක්ද නොමිලයේ ලබා දුන්නෙමු. කරුණාකර මෙම පුරුෂයින් උදෙසා යාච්ඤා කරන්න.



*JOSHUA WARRIORS Men's Camp at Mahabalipuram*


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

ඔබ සියලු දෙනා මෙන්ම අපත් මෙම නත්තල් මාසයේදී බොහෝ ශුභාරංචි රැස්වීම් මාලාවන් හා බොහෝ වැඩසටහන් පැවැත්වීමට සූදානම් වන බැවින් අප ඉතා කාර්යබහුලව සිටී. මෙම කාලය අපට ඉතාම වැදගත්ය. එම නිසා මෙම කාලය අපි ප්‍රයෝජනයට ගෙන අප අන් අයට තෑගි දෙමින් කෑම බීම හා ඇඳුම් පැළඳුම් සපයා දෙමින් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය විවිධාකාරයෙන් අන් අයට ප්‍රකාශ කරමු. 2024 වන වසරේදී අප හා සමඟ එකට සිටිමින් අපව යාච්ඤාවෙන් දරාගත්තාවූ සෑම දෙනාටම අපි ස්තුති වන්ත වෙමු. අප පසුකලාවූ උන්වහන්සේගේ දණ්ඩෙන් හා සැරයටියෙන් අපව සැනසුවේය. ''ඔබගේ දණ්ඩෙන් හා සැරයටියෙන් මට සැනසිල්ල ලැබේ.'' (ගීතාවලිය 23:4) තවත ලබන්නාවූ නව වසරද අපට බලවත් ආශිර්වාද ලැබීමට ඇති බව විශ්වාස කරමු.

අප ඔබට අතිශයෙන්ම ප්‍රේම කරමු. අපි ඔබ උදෙසා යාච්ඤා කරමු. එලේසම ඔබත් අප උදෙසා යාච්ඤා කරන්න.

*''ස්වාමීන්වහන්සේ නුඹට ආශිර්වාද කොට නුඹ ආරක්ෂාකරනසේක්වා. ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ කෙරෙහි බබළවා නුඹට කරුණාකරනසේක්වා. ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ කෙරෙහි ඔසවා නුඹට සමාදානය දෙනසේක්වා.'' (ගණන් කථාව 6:24 - 26)*

**යෙසුස ක්‍රසතුසවහනසෙ තුල ඔබගෙ සෙවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

**... All continued with one accord in prayer and supplication, with the women and Mary the mother of Jesus, and with His brothers. Acts 1:14**

*We wish to pray together with Godly people of the Southern Districts of Tamil Nadu!*

**Please pray for** **Deliverance Prayer for God's Children and World Peace!**

**Place: Echo of His Call World Peace Prayer Centre,**
Alwarcoil Junction, Vattam Road,
Eranial–Thuckalay Main Road,
Neyyoor P.O., Kanyakumari District-629 802.

**Time : 13-12-2024**
**2nd Friday**
**10.00 A.M. to 12.00 noon**



**Pastor S. Sam Selva Raj will join with his ministerial workers.**

Pastor S. Sam Selva Raj was born and received God's calling in Kanyakumari District and he is having multifarious ministries for the past 55 years, with his Head Quarters in Chennai.

As per the revelation from God, God willing this meeting will be conducted on the second Friday of every month at 10.00 A.M. Sick will be prayed for! The Lord Jesus Christ will do wonders!!

God's children who are enabled by the Lord can join. Children of God residing far and having a burden for this prayer can pray from their respective places at the same time.

**Administrative Committee: Echo of His Call Ministries Cell: 98412 71858**

*1 පිටුවෙන්....*

සැඟව තිබෙන බව පෙන්නුම් කෙරේ. මිනිස් සමාජය කෙරෙහි සමාදානය හා ප්‍රීතිය ලැබෙන බවත් මේ පණිවිඩයෙන් ප්‍රකාශ කරයි.

යෙසායා අනාගතවක්තෘ තුළින් ඉතා අලංකාර පණිවිඩයක් අපට ලබාදෙයි. ***"මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේය; ආණ්ඩුවද උන්වහන්සේගේ කරපිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත් දෙවියන් වහන්සේය, සදාකාල පියානෝය, සමාදානයේ කුමාරයා යයි කියනු ලබන්නේය." (යෙසායා 9:6)*** පාපයෙන් සහ ශාපයෙන් ජීවත් වෙන්නා වූ සෙනඟට සමාදානයේ කුමාරයෙක් හැටියට යේසුස් වහන්සේ මෙලොවට පැමිණුනුයේය.

## දෙවියන්වහන්සේගේ සමාදානය අපගේ නැංගුරමයි.

දෙවියන් වහන්සේගේ සමාදානය අපගේ නැන්ගුරමයි. දෙවියන් වහන්සේගේ සමාදානය අපගේ ආත්මයට බලවත් නැංගුරමකි. පාවුළු තුමා පිළිප්පි පොතෙහි මෙසේ ලියන ලියනු ලබයි. ***''නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහිදී ස්තුති දීම සමග යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වාපල්ලා එවිට කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන් වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත." (පිලිප්පි 4:6-7)*** මෙම කොටස තුළ අපගේ ජීවිතයට පැමිණෙන සෑම කුණාටුවකටම සියලු සමාදානය ලැබෙන බවත් ක්‍රිස්තුස් වහන්සේ කරණ කොට ගෙන දෙවියන් වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවය අප ස්ථිරවන විට උන්වහන්සේගේ අභිමුඛත්වයෙහි ස්වාමීන් වහන්සේගේ සැලකීම අපට ලැබෙන බවට සහතික වෙයි. මේ උත්සව සමයෙහි පමණක් නොව අපගේ ජීවිතයෙහි සෑම මොහොතකම දෙවියන් වහන්සේගේ සමාදානය අප තුළ තිබෙනවා.

උන්වහන්සේගේ සමාදානය අපව වටකරගෙන සිටින නිසා අපි කිසිවිටක තනි නොවී සිටිමු.

## පාපයෙන් සහ ලැජ්ජාවෙන් නිදහස !

නත්තලේ උතුම් බලවත් පණිවිඩය නම්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපගේ පාපයටත් ලැජ්ජාවටත් නිදහසක් ලැබෙන බවයි. අද සමාජය කැඩී බිඳී ගොස් පාපයේ ජීවත්වීම පමණක් නොව ඒ හැඟීම තුළ ලැජ්ජාවෙන් මනුෂ්‍යයා ජීවත් වෙයි. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ උපත තුළ ඒ මිදීම උන්වහන්සේ අපට දී තිබේ. දේවදූතයා මරියාට මෙසේ පැවසුවේය; ***''මක්නිසාද දෙවියන් වහන්සේගෙන් වූ කිසි වචනයක් බල රහිත නොවන්නේය" (ලූක් 1:37)*** මෙසායා නමැති ගැලවුම්කරුගේ පැමිණීම ආශ්චර්යමත් ක්‍රියාවක් පමණක් නොව දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයාටත් අතර අලුත් ගිවිසුමක් ඇතිවන්නා වූ දෙයකි. යේසුස්වහන්සේ අපව පාපයෙන් මුදවන්නට පැමිණුනේය. මතෙව් 1:21 හි මෙසේ පවසයි; ***''ඇ පුත්‍රයෙකු වදන්නීය; උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්නඃ මක්නිසාද තමන්ගේ සෙනග ඔවුන්ගේ පාපවලින් ගලවන්නේ උන්වහන්සේ යයි කීවේය."***

පාවුලු තුමාද මෙම පණිවිඩය රෝම 8:1 හි මේ ආකාරයෙන් සනාථ කරයි. ***''එහෙයින්" ක්‍රිස්තුස් යේසුසවහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත්කිරීමක් නැත.''*** මේ තුළින් අපට තේරුම් ගැනීමට හැකිවන්නේ දෙවියන් වහන්සේ අපට දෙන බලාපොරොත්තුව හා යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේදී අපගේ පාපයත් ලජ්ජාවත් දරා ගත් බවයි. අපට කමාව පමණක් නොව උන්වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ දරුවන් වන හැටියට ජීවත්වීමටද බලය දුන් සේක.

## කමා කිරීමේ බලය!

දෙවියන් වහන්සේගේ සමාදානය අප තුළ තිබෙන කල්හි ක්‍රිස්තුස් වහන්සේ කරණ කොටගෙන අපි දෙවියන් වහන්සේගේ සමාව ද ලබා ගනිමු. මෙම සමාව අපට ලැබුණේ අපගේ සියලු පාපයත් ලජ්ජාවත් නිසාය.මෙම සමාව කරණකොට ගෙන අපිට ස්වාමීන් වහන්සේ සමඟ නිදහසේ ගමන් කිරීමට පුළුවන. පාවුලු තුමා කොලොස්සි 1:13-14 හි මෙසේ පවසයි. ***''පියාණන් වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවාගත්සේක. උන්වහන්සේ තුළ අපගේ මිදීම වන, පව්වලට කමාව අපට තිබේ.''*** නත්තල යනු මෙම සත්‍යතාවය කරනකොට ගෙන අපගේ අතීතයෙහි අපට තිබූ සියලු බර සහ වරදකාරීත්වයේ හැඟීම්වලින් මුදවා නිදහස් වීම සැමරීමයි. එනම් දෙවියන් වහන්සේ වෙතට යාමට අපගේ අතීතයෙහි සිදු වූ පාපයේ වරද අපට බාධාවක් නොවන්නේය. ක්‍රිස්තුස්වහන්සේ තුළ බලාපොරොත්තුව සමග උන්වහන්සේ වෙතට සමීපවීමට අපට හැකිය.

## කැඩුනාවූ බිඳුනා වූ ලෝකයට බලාපොරොත්තුව !

අද ලෝකය සෑම අංශයකින්ම වැටී තිබේ. මිනිසුන්ගේ ජීවිතවල සම්බන්ධතාවයන් කැඩී බිඳී තිබේ. සමාජය අධාර්මික ක්‍රියාවලින් පිරී ඇත. මිනිසුන් බොහෝ දුක් වේදනාවන්ගෙන් මිරිකී සිටිති. මෙවැනි ලෝකයකට ක්‍රිස්තුස් වහන්සේගේ ඉපදීම මහත් වූ බලාපොරොත්තුවක්

*....Contd. to page 6*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**දෙසැ:19**- අපගේ සියලුම සහකාර සංස්කාරකවරුන් සහ ඔවුන්ගේ පවුල් නිසා ස්තුති කරන්න.

**දෙසැ:20**- අපගේ ශුභාරංචි පත්‍රිකා කාලය සහ එහි කාර්යක්ෂම කර්ය මණ්ඩලයේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය නිසා ස්තුති කරන්න.

**දෙසැ:21**-අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැතිතුමා සහ ඔහුගේ පවුල කෙරෙහි දිව්‍යමය ආරක්ෂාවත් සියලු ආකාරයේ නපුරු බලවේගයන්ගෙන් ඔවුන්ව ආරක්ෂා කරන නිසාත් ස්තුති කරන්න.

**දෙසැ:22**- අපගේ ශුභාරංචි සේවකයින්ගේ නොසැලෙන කැපවීම නිසා ස්තුත් කරන්න.

**දෙසැ:23**- අපගේ යාච්ඤාව හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, විශ්වාස හවුල්කරුවන්, ජීවිත හවුල්කරුවන් සහ මහා සභා හවුල්කරුවන් මත හා ඔවුන්ගේ පවුල් වලට දෙවියන්වහන්සේගේ දයාව සහ කරුණාව දී තිබෙන නිසා ස්තුති කරන්න.

**දෙසැ:24**- අපගේ විවිධ සේවාවල සිටින සේවකයන්ගේ පවුල්වලට එතුමාගේ නොමඳ ආශිර්වාදය නිසා ස්තුති කරන්න.

**දෙසැ:25**- අප සියල්ලන් මුදවා ගැනීමට පැමිණි ලෝකයේ ගැලවුම්කරු වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත නිසා ස්තුති කරන්න.

**දෙසැ:26**- මේ වසරේ අපගේ සියලුම නත්තල් සැමරුම් නිසා ස්තුති ස්තුති කරන්න.

**දෙසැ:27**- ශාන්ත පාවුළු මෙට්‍රික්යුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විද්‍යාල සහ අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව තුළින් අවශ්‍යතා ඇති අයට බලපෑමක් වූ නිසා ස්තුති කරන්න

**දෙසැ:28**- 2024 සහ 2025 යන වර්ෂ සඳහා කැඳවීමේ ප්‍රතිරාවය තුළින් පැවැත්වූ විශේෂ රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීමට උපකාර වූ නිසා ස්තුති කරන්න

**දෙසැ:29**- මේ වසර පුරාවටම දෙවියන්වහන්සේගේ සේවකයින්ට ලබා දුන් දිව්‍යමය ආරක්ෂාව නිසා ස්තුති කරන්න.

**දෙසැ:30**- මෙම වර්ෂය තුලදී කිතුණු සංවිධානවල සාර්ථක හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වූ නිසා ස්තුති කරන්න.

**දෙසැ:31**- 2024 වන වර්ෂයේදී ඉතා ආශ්චර්‍යමත් ලෙස අපගේ සියලු අවශ්‍යතා සපුරාලූ නිසා ස්තුති කරන්න.

**ජන:01**- ලොව පුරා විසිරී සිටින සියලුම පාඨකයින්ට සහ ජනතාවට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම හා ආශිර්වාදය අපව 2025 නව වසරට මඟපෙන්වා ගෙනයන නිසා ස්තුති කරන්න.

**ජන:02**- 2025 නව වසරේ පොරොන්දු සියලුම සභාවන්ට හා ඇදහිලිවතුන්ට බලාපොරොත්තුව ආශිර්වාදය ගෙනෙන නිසා ස්තුති කරන්න.

**ජන:03**- 2024 වර්ෂයේදී සියලුම ක්‍රිස්තියාන් සංවිධාන සහ පල්ලි සඳහා අඛණ්ඩ ආශිර්වාද ලැබෙන නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජන:04**- ලොව පුරා සාමයේ සහ මනුෂ්‍යත්වයේ වර්ධනය වන පිණිස යාච්ඤා කරන්න.

**ජන:05**- ලොව පුරා සිටින මිනිසුන් නව රෝග වලින් ආරක්ෂා වීම හා යහපත් සෞඛ්‍යයක් ලබා දෙන්න කියා යාච්ඤා කරන්න.

**ජන:06**- නපුරු බලවේගයන්ට එරෙහිව සියලුම සභාවන් මත දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:07**- ලෝක නායකයන් දිව්‍ය ප්‍රඥාවෙන් මඟ පෙන්වනු ලබන පිණිසත්, ඔවුන් සියලු මිනිසුන්ගේ යහපැවැත්ම සඳහා ක්‍රියා කරන පිණිසත් යාච්ඤා කරන්න.

**ජන:08**- ශාන්ත පාවුලු මෙට්‍රික්යුලේෂන් පාසලේ, නෙහෙමියා බයිබල් විද්‍යාලයේ සහ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාවේ විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයින් හා කාර්ය මණ්ඩලය උදෙසා යාච්ඤා කරන්න.

**ජන:09**- 2025 වසර පුරාවටම දේවගැති S. Sam Selva Raj සහ ඔහුගේ පවුලේ අයට දෙවියන්ගේ බලවත් හස්තය තබන්න කියා යාච්ඤා කරන්න.

**ජන:10**- ජාතීන් අතර සාමය සහ ආර්ථික සමෘද්ධිය ඇති වන පිණිස යාච්ඤා කරන්න.

**ජන:11**- සෑම තැනකම ජීවත් වෙන්නාවූ සියලු පවුල් තුල සමගිය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ජන:12**- මේ මාසය තුලදී අපගේ අවශ්‍යතා සපයන්න කියා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

**ජන:13**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැතිවරයාගේ ජීවිත කථාව රචනා කිරීම සාර්ථකව නිම කිරීමට උපකාර කරන්නය කියා යාච්ඤා කරන්න.

**ජන:14**- අපගේ දේව සේවය පුළුල් කිරීම සහ ලොව පුරා ශුභාරංචිය පැතිරීම උදෙසා යාච්ඤා කරන්න.

**ජන:15**- යෞවනයන් අතර ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සහ ඔවුන් ශුද්ධත්මයාණන්ගෙන් පිරී යන පිණිස යාච්ඤා කරන්න.

**ජන:16**- කිතුනුවන් දෙවියන් වහන්සේගේ වචනය අනුගමනය කිරීමට සහ ක්‍රිස්තුස් වහන්සේගේ මෙන් චරිතයක් විදහා දැක්වීම පිණිස යාච්ඤා කරන්න.

**ජන:17** - අපගේ සේවය සඳහා සුදුසු සහ කැපවූ සේවකයින් ලබා දෙන්න කියා යාච්ඤා කරන්න.

**ජන:18** - අපගේ යාච්ඤා හවුල්කරුවන් දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලයටම හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් වලට දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

ගෙන දෙන්නා වූ දෙයකි. මේ ලෝකයට දෙවියන් වහන්සේගේ ඇති අධික ප්‍රේමය නිසා ක්‍රිස්තුස්වහන්සේව මේ ලෝකයට එවන ලද්දේය. උන්වහන්සේ ආලෝකය ලෙස මේ ලෝකයට ආවේ. මේ අඳුරු ලෝකය තුළ උන්වහන්සේ ආලෝකය මෙන් බබලයි. යොහාන් 8:12 හි මෙසේ පවසයි ***''මම ලෝකයේ ආලෝකය ය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කීසේක.''*** මෙම ආලෝකය බලාපොරොත්තුව හා බිඳුනා වූ මේ ලෝකයට ප්‍රීතිය ගෙන දෙයි.

ශුද්ධවූ පාවුළුතුමා අපට මතක් කර දෙන්නේ අපගේ බලාපොරොත්තුව; ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබෙන ඇදහිල්ලේ නැංගුරුමක් ලෙසයි. මෙය අපගේ වර්තමානයටත් අපගේ අනාගතයටත් බලාපොරොත්තුව ගෙන දෙයි රෝම 15: 13 හි මෙසේ පවසයි. ***''ඉදින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් නුඹලා අධික බලාපොරොත්තුවෙන් යුක්තව සිටින පිණිස බලාපොරොත්තුවේ දෙවියන් වහන්සේ ඇදහිල්ලෙන් වූ සියලු ප්‍රීතියෙන්ද සමාදානයෙන්ද නුඹලා පූර්ණකරනසේක්වා.''*** මේ නත්තල තුළින් ක්‍රිස්තුස් වහන්සේ අපට ගෙන දෙන බලාපොරොත්තුව ගැන අප සිහිකරනවාක් මෙන් මෙම බලාපොරොත්තුව නැති අයටත් දුක් පීඩා විඳින අයටත් කැඩී බිඳී සිටින අයටත් ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබෙන බලාපොරොත්තුව ප්‍රකාශ කිරීම අපගේ යුතුකමකි.

## බලාපොරොත්තුව නොමැති අයට බලාපොරොත්තුව!

නත්තලේ පණිවිඩය ආශිර්වාදය නම් බලාපොරොත්තුව නැති අයට බලාපොරොත්තුවක් දිය යුතුය. බොහෝ අය තමාගේ ප්‍රශ්න නිසා නැති වූ ස්ථානයක සිටි. ඔවුන්ගේ ජීවිතයෙහි ඇති ප්‍රශ්න හා කරදර නිසා ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වී තිබේ. නමුත් යෙරමියා ප්‍රොපේතවරයා මෙසේ පවසයි; ***''මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනාය.'' (යෙරමියා 29:11)***

යේසුස් වහන්සේ අපට බලාපොරොත්තුවක් දෙමින් පවසන්නේ; අපගේ ජීවිතයට සැනසීමත් අරමුණත් බලාපොරොත්තුවත් සෑම අවස්ථාවකදීම දෙන බවටයි. ලෝකය බලාපොරොත්තු රහිතව සිටින අවස්ථාවේදී නත්තලේ යේසුස් වහන්සේ දෙන පණිවිඩය නම්; ඔබගේ අඳුරු මොහොතට උන්වහන්සේ බලාපොරොත්තුවක් ගෙන දෙන බවයි.

## ප්‍රශ්නකාරී ලෝකයට යේසුස්වහන්සේ සමාදානයේ කමාරයෙකි !

අප මේ ලෝකේ බොහෝ අභියෝගවලට, දිළිඳුකමට, අධර්මිෂ්ඨකම්වලට හා බෙදීම්වලට මුහුණ දෙමු. නත්තල සමරන්නා වූ මේ මොහොතේදී දෙවියන් වහන්සේ අපට මතක් කර දෙන්නේ; ක්‍රිස්තුස් වහන්සේ මේ ලෝකයට පැමිණුනේ ජීවිතය සමඟ සටන් වදින අයට උන්වහන්සේගේ සමාදානය දෙන බවයි. තවද උන්වහන්සේගේ එම සමාදානය කරණ කොට ගෙන සමාදානය නැති අයගේ ජීවිතයට සමාදානය ඇති කරයි. ***''සමාදානයකරන්නෝ ආශිර්වාද ලද්දෝය; මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝයයි කියනු ලබන්නෝය.'' (මතෙව් 5:9)*** යේසුස්වහන්සේගේ සේවා කාලයේදී උන්වහන්සේ කරනු ලැබූයේ මිනිස් ජීවිතයට සමාදානය ඇති කිරීමයි. එනම් සුවකිරීම, කැඩුණාව බිඳුනා වූ හදවත් වලට සමාදානය, පීඩිතව සිටින අයට බලාපොරොත්තුව යන මේ සියල්ලම දෙමින් මනුෂ්‍යාව දෙවියන් වහන්සේ සමඟ සමාදාන කළේය. ක්‍රිස්තුස්වහන්සේ අපටද සමාදානය දෙමින් අපව දෙවියන්වහන්සේ සමඟ එකතු කළ ආකාරයටම අපද අන් අයව ස්වාමීන් වහන්සේ වෙතට ගෙන යමින් උන්වහන්සේ සමඟ සමාදාන කළ යුතුමයි.

## සභාවේ වගකීම!

ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය මේ ලෝකයට දීමට සභාව බැඳී සිටියි. අප ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය හැටියට දෙවියන් වහන්සේගේ ප්‍රේමය සහ කරුණාව සෑම ආකාරයෙන්ම ප්‍රකාශ කළ යුතුයි. පාවුලු තුමා එපීස 2:14 - 16 දක්වා මෙසේ පවසයි. ***''මක්නිසාද වෙන්කිරීමේ මැද***

*බිත්තිය බිඳ දමා ඒ සතුරුකම නමැති නියෝගවල අන්තර්ගත වූ ආඥාවල ව්‍යවස්ථාව තමන්ගේ මාංශයෙන් නැති කොට දෙගොල්ල එක් කල උන්වහන්සේම අපේ සමාදානයව සිටින සේක; එසේ කළේ සමාදාන කමින් තමන් තුළ දෙගොල්ල එක අලුත් මනුෂ්‍යයෙක් කොට මවන පිණිසත්, කුරුසියෙන් සතුරුකම නැසූ බැවින් දෙගොල්ලම එක ශරීරයක් කොට, කුරුසිය කරණ කොටගෙන දෙවියන් වහන්සේට සමගිකර දෙන පිණිසත්ය.''*

ක්‍රිස්තුස්වහන්සේ දෙන්නා වූ සමාදානයට සභාවට තිබෙන යුතුකම නම් මෙම පණිවිඩය කැඩුනාවූ බිඳුනා වූ මේ ලෝකය වෙතට ගෙනයාමයි. ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානයත් ගැලවීමත් මේ ලෝකයට දීමට සභාව බැඳී සිටී.

## මනුෂ්‍යයාගේ හදවත බයෙන් කනස්සල්ලෙන් සුව කිරීම!

මේ උත්සව සමයේදී බොහෝ දේවල් ගැන අපට බයක් තිබේ. කනස්සල්ල අධෛර්‍යකම් යන මෙවැනි දේ අප තුළ වැඩි වැඩියෙන් තිබේ. අපිට තිබෙන ප්‍රශ්න හා ගැටලු සහගත තත්ත්වයන් දරාගැනීමට නොහැකි මට්ටමකට අපව ගෙනයාමට හැකිය. නමුත් ක්‍රිස්තුස්වහන්සේ මේ සියල්ලේ දී ඔබට සුවය දීමට සූදානම්ව සිටී.ඔබගේ වෙහෙසට පත් වූ ආත්මය සුව කරමින් සැනසීම දීමට යේසුස්වහන්සේ සූදානමින් සිටින සේක.

## දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය සනාථ කිරීම!

අපගේ වේදනාකාරී අවස්ථාවන්හිදී දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය පෙන්වීමට අපට ආරාධනා කරයි. දාවිත් ගීතාවලිය 23:4 පදයෙහි මෙසේ සඳහන් කරයි; ***''එසේය මරණ සෙවනේ මිටියාවත මැදින් යන්නම් නමුත් කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි. මක්නිසාද ඔබ මා සමගය ඔබගේ දණ්ඩෙන් හා සැරයටියෙන් මට සැනසිල්ල ලැබේ.''*** මෙම පදයෙන් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අපි හා සමග තිබෙන බව සනාථ කරයි. තවද අපගේ කරදරකාරී අවස්ථාවන්වලදී අප තනිව නැතැයි කියා ස්ථිරත්වයක් මෙයින් ලබාදෙයි.

තවද පේත්‍රුස් තුමා අපව මෙලෙස ධෛර්යමත් කරයි. ***''උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ හැම කරදර උන්වහන්සේ පිට තබාපල්ලා." (පේත්‍රුස් 5:7)*** අපගේ ඕනෑම බරක් ඕනෑම වේලාවක දී උසුලා ගැනීමට දෙවියන් වහන්සේට ප්‍රශ්නයක් නොවෙයි. අපගේ වේදනාව හා භය ස්වාමීන්වහන්සේට භාරදුන් විට උන්වහන්සේ අපට සමාදානය දෙමින් උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ අපව තබා ගනියි.

## යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් සුවය!

යේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණුනේ කැඩුනාවූ බිඳුනා වූ සිත් සුව කරන පිණිසයි. අපගේ හදවත කැඩී බිඳී තිබෙන ඕනෑම අවස්ථාවක සුවය ලබා ගැනීමට උන්වහන්සේ වෙතට හැරීමට අපට හැකිය හැකිය. ***''ස්වාමී වූ දෙවියන් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරන්ට ස්වාමීන් වහන්සේ මා ආලේප කළ සේක. බිඳුනු සිත් ඇත්තන් සුව කරන්ටද, වහලුන්ට නිදහසත් හිරකාරයන්ට හිරගෙයින් මිදීමත් ප්‍රකාශකරන්ටද," (යෙසායා 61:1)*** මෙම පොරොන්දුව තුළින් අපට පෙන්වන්නේ අපගේ හැඟීම්වලටත් අපගේ

....Contd. to page 9

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Qualification : 10th Standard & above
ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE
REACHING NATIONS
Rush for admission! Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology
Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**“...කියවන්නා තේරුම් ගනීවා....”** *(මතෙව් 24:15)*



## අසාර්ථකත්වය නායකයින්ගේ සාර්ථකත්වය වෙයි !

**MY FAILURES WERE LADDERS FOR SUCCESS!**

කැඳවීමේ ප්‍රතිරාවය සේවය මනුෂ්‍යයන්ගේ බලයෙන්වත් මුදල්වල බලයෙන්වත් නොව යාච්ඤාවේ බලය කරණකොටගෙන ගොඩනංවා තිබේ. මෙය පුද්ගලික යාච්ඤා කණ්ඩායම්, නිරාහාර යාච්ඤාවන්, සර්ව රාත්‍රී යාච්ඤාවන් තුළින් ගොඩ නැංවූ සේවයකි.

කැඳවීමේ ප්‍රතිරාවය හරහා සමහර වෙලාවට උන්වහන්සේ අපගේ ජීවිත වලට නොයෙකුත් ප්‍රශ්න කරදර ගෙන ආවේය. එසේම අපට මහත් ලෙස උදව් උපකාර කලාවූ අයව උන්වහන්සේ අප වෙතට ගෙනෙමින් ඉතා ආශ්චර්යමත් ලෙස මඟපෙන්නුවේය. මා නැවත හැරී බලන විට අපගේ සේවයට විරුද්ධකම් කලාවූ සියලු දෙනා අතර දෙවියන්වහන්සේ මට මඟපෙන්වූයේ කෙසේද කියා මා අත්දුටුවෙමි. තවද කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළින් තමාගේ ජීවිතයට බලවත් ලෙස ආශිර්වාදය ලැබූ අයගේ ජීවිත දෙස බලන විට මා දෙවියන්වහන්සේට ස්තූති කරමු.

සර්ව රාත්‍රී යාච්ඤාවට සහභාගී වූ අයට පමණක් නොව මටද පුද්ගලික ලෙස බලවත් ආශිර්වාද ලැබුණි. මෙම යාච්ඤාව ආරම්භයේදී සුලු පිරිසක් පැමිණි අවස්ථාවේදී අපට කිසිදු ප්‍රශ්නයක් ඇති නොවූ නමුදු සෙනඟ වැඩිවෙන්නට පටන්ගත් විට අපට බොහෝ ප්‍රශ්න වලට මුහුණ දෙන්නට සිදු විය. එවිට අපට නමස්කාර කිරීමටද ස්ථානයක් නොතිබුන නිසා අප මුහුදු වෙරළට ගොස් මුළු රාත්‍රිය පුරාම යාච්ඤා කලෙමු.

මෙම ස්ථානයට සෙනඟ වැඩි වැඩියෙන් එන්නට පටන්ගත්තේය. බොහෝ අයගේ ජීවිත වෙනස් වී ආශිර්වාදය ලැබීමට පටන්ගත්තේය. අප මෙම යාච්ඤාව දිගටම පවත්වාගෙන යන විට උන්වහන්සේ අපට මාර්ග විවෘත කර ශාලාවක් කුලියට ගෙන මෙම සර්ව රාත්‍රී යාච්ඤාව පැවැත්වීමට උපකාර කලේය. මෙම යාච්ඤාව කරණකොටගෙන දෙවියන්වහන්සේ අද අපටම කියා ගොඩනැගිල්ලක් දී තිබේ.

කිසි කෙනෙකුගේ කරුණාවක් හෝ උපකාරයක් නොමැතිව අපගේම ස්ථානයක් තුල දෙවියන්වහන්සේව නමස්කාර කිරීමටත් සර්ව රාත්‍රී යාච්ඤාවන් පැවැත්වීමටත් උන්වහන්සේ ආශිර්වාද කර තිබේ. අපට මෙම ජයග්‍රහණය ලැබීමට වසර ගණනාවක් ගත විය. මේ උදෙසා අපට ඉතා ඉවසීමෙන් යුතුව බලා සිටීමට සිදු විය.

ප්‍රිය සහෝදරය සහෝදරිය දෙවියන්වහන්සේ සමහර දේ තුළින් ක්ෂණිකව ක්‍රියා නොකරයි. උන්වහන්සේ අපගේ යාච්ඤා ජීවිතයත් අපගේ ජීවිතයත් සෝදිසි කර නිසි වේලාවට උන්වහන්සේ ඔබව ඔසවයි. එතෙක් උන්වහන්සේගේ දෑතෙහි යටත්ව සිටින්න.

***“එබැවින් දෙවියන්වහන්සේ සුදුසු කාලයේදී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට යටත්වෙයල්ලා.” (1 පේත්‍රුස් 5:6)***

*************


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for BIBLECOR**

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**



**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

....Contd. from page 7

ශරීරයටත් හා අපගේ ආත්මයටත් ස්වාමීන් වහන්සේ ගෙන දෙන්නා වූ සුවයයි. යේසුස්වහන්සේ දෙස බැලීමෙන් උන්වහන්සේ අපගේ වේදනාව තේරුම් ගනියි. උන්වහන්සේගේ පාමුල අපගේ බර තබන්නය කියා එතුමා අපට පවසයි. එවිට ස්වාමීන් වහන්සේගේ සමාදානයත් බලයත් අපට හිමිවෙයි.

## අපගේ පරම සමාදානය යේසුස්වහන්සේයි!

අපගේ ජීවිතයේ සෑම විටම අප තේරුම් ගත යුතු සත්‍යතාවය නම් අපගේ පරම සමාදානය යේසුස් වහන්සේ පමණක්ම බවයි. උන්වහන්සේ අපට දෙන්නා වූ සදාකාලික බලාපොරොත්තුව කරණ කොටගෙන අපට තිබෙන එකම සමාදානයේ බලාපොරොත්තුව නම් යේසුස්වහන්සේ පමණක්මයි.

## අපගේ දිනපතා ජීවිතයේ සමාදානය අත්පත් කර ගනිමු!

මෙම සමාදානය අප අත්දැකීමට නම්, ක්‍රිස්තුස්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය දිනපතා වැඩි කර ගත යුතුයි. ''***ඉතින් සහෝදරයෙනි, යම් පමණ දේ සැබෑද, යම් පමණ දේ ගරුකටයුතුද, යම් පමණ දේ සාධාරණද, යම් පමණ දේ පිරිසිදුද, යම් පමණ දේ ආදරණීයද, යම් පමණ දේ යහපත් කීර්තියක් ඇතිව තිබේද, යම් ගුණයක්, යම් ප්‍රශංසාවක් ඇද්ද, ඒ දේවල් මෙනෙහි කරපල්ලා." (පිලිප්පි 4:8)***

මෙවැනි සිතුවිලි සමඟ සෑම දිනකම උන්වහන්සේ සමඟ අප සම්බන්ධතාවය පවත්වනවා නම් දෙවියන්වහන්සේගේ සමාදානය අපගේ ජීවිතයේ සෑම දිනකදීම පවතිනු ඇත.

ශුද්ධ වූ පාවුලු තුමා ආත්මික පළ ගැන ගලාති 5:22-23 හි කතාකරයි. එනම් අපි ආත්මයෙන් ඇවිදින කල්හි ස්වාමීන් වහන්සේට අපි අපව භාර කරන විට උන්වහන්සේගේ සමාදානය අප තුළට නිනැතින්ම පැමිණෙනවා පමණක් නොව එය අපගේ ජීවිතයේ කොටසක්ද වෙනු ඇත. ඒ තුළින් අපගේ ජීවිතය හරහා අන් අයට කරුණාවත් දයාවත් දැක්වීමට පුළුවනි.

## සමාදානයේ දීමනාව බෙදාගැනීමයි!

ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය අපගේ ජීවිතය වෙනස් කරන බව අප අත්දකින විට භේදකමින් පිරී සාමයක් නොමැති ලෝකයට අපි මෙම සමාදානය බෙදා දිය යුතුයි. අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ ලබා ගත්තා වූ බලාපොරොත්තුව අන් අය සමග එනම්; බලාපොරොත්තුවක් නැත්තා වූ අයට බෙදා දෙමු. මේ නත්තලේ දී ක්‍රිස්තුස් වහන්සේව නොදන්නා වූ අයට දෙවියන්වහන්සේගේ සමාදානය ලබා ගන්න පිණිස ආරාධනා කරමු.

## සැබෑ නත්තලේ ආත්මය!

නත්තල යනු නිවාඩු කාලයක් පමණක් නොව දිව්‍යමය පණිවිඩය වන සමාදානය, බලාපොරොත්තුව හා සුවය යේසුස් වහන්සේගේ උපත කරන කරන කොටගෙන

**Pray for IMMEDIATE REQUIREMENT**

**ECHO OF HIS CALL is expanding at a fast pace. We need mission minded, dedicated and faithful men and women candidates for the following positions:**

- Full time Assistant Pastors for our Main Church
- Full time Assistant Pastors for our Branch Churches in Chennai
- Full time security personnel
- DTP Operators and Typists
- Candidates with proficiency in speaking and writing English and other languages
- Managers and Co-ordinateors interested in School & Office Administration
- Full time Bible College Lecturers
- Volunteers who can promote our ministry in cities & villages
- Hon. Co-ordinators to serve in Editorial Board of **Echo of His Call**
- Full time Drivers
- Principal and Teachers for Matriculation School
- Full time female cooks
- Full time housekeeping employees

**Salary based on qualification and experience.**

Please Contact **ECHO OF HIS CALL** office
**Apply at Whatsapp No : 98412 71858**
**Email : sam@echoofhiscall.org**

RNI NO. TN/SIH/2006/17846

සැමරීමයි. යේසුස්වහන්සේ කරණකොට ගෙන සැබෑ සමාදානයත් දෙවියන් වහන්සේ සමඟ තිබෙන්නා වූ සම්බන්ධතාවයත් මිදීමත් කැඩුනාවූ බිඳුනා වූ දේශයට සුවයත් සමාදානයත් ලබා දෙමින් සමාදානය කරන්නෙක් වෙමු. මේ ලෝකේ තුළ සිටින්නා වූ මනුෂ්‍යයින් නිතරම ප්‍රශ්නකාරී බෙදීම්වලින් ජීවත් වෙයි. නමුත් යේසුස්වහන්සේ පැමිණුනේ අපව සමගි කිරීමටයි. ප්‍රේමය කරණකොටගෙන අපි දෙවියන් වහන්සේගේ හදවතට සමීප වෙමින් උන්වහන්සේගේ ප්‍රේමය හා සමාදානය මේ ප්‍රශ්නකාරී ලෝකයට බෙදා දීමයි සැබෑ නත්තල වනුයේ, මෙවැනි ආත්මයක් අපගේ හදවත තුළ ඇති කරගනිමින් මේ නත්තල සැබෑ නත්තලක් කරගනිමු.

පාවුලුතුමා පවසන ආකාරයට ***''ක්‍රිස්තුස් වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත් වල ආණ්ඩුකෙරේවා. ඒ පිණිස නුඹලා එක ශරීරයක්ව සිටීමට කැඳවාගනු ලැබූවහුය. ස්තුතිවන්තව ද සිටපල්ලා." (කොලොස්සි 3:15)*** මෙම නත්තලේ අපව ස්වාමීන් වහන්සේගේ සමාදානයට තවත් ලන් කෙරේවා. ක්‍රිස්තුස් වහන්සේගේ සමාදානයෙන් මුල්ඇද උන්වහන්සේගේ බලය කරන කොටගෙන විනාශකාරී මේ ලෝකයට මෙම සුභ පණිවිඩය අපි ප්‍රකාශ කරමු.

************

## Echo of His Call

**YouTube**

Please subscribe

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks. - **Editor**

## ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **DECEMBER 2024.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**